ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2024.07.22

පැමිණිලිකරු - බී.වී.එල්.සී.බෙතරගම මිය,
ප්‍රතිරාජ මාවත, කෙසෙල්හේනාව,
අගුරුවාතොට.

වගඋත්තරකරු - සභාපති,
ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක - 21, විරකියා විදිය, කොළඹ 12.

**පැමිණිලි අංක - එච්.ආර්.සි/617/22**

තමා 2017.10.02 දින කළමණාකරු ධූරයේ MM-(1-1) ශ්‍රේණියට උසස්වීමක් ලැබූ බවත් එහිදි 2017.09.26 වන දිනෙන් අධ්‍යක්ෂ මණ්ඩල තිරණය පරිදි තමාට ප්‍රවාහන දීමනාව රු.50000/- හා ඉන්ධන පහසුකම් ලීටර 120 ක් ලබාදුන් බවත් එය තමාගේ පත්වීම් ලිපියේද සඳහන් වූ බවත් නමුත් 2021.09.30 හා 2021.11.02 දිනැති ලිපි මගින් තම ධූරයට අදාළ MM-(1-1) ශ්‍රේණියට ප්‍රවාහන හෝ ඉන්ධන දිමානාවක් ලබාදිමට හැකියාවක් නොමැති බව දැනුම්දී අදාළ දීමනාව නවතා දැමූ බවත් එම අනිතිකව ගත් තිරණය මත තමා අගතියට පත් වූ බව දක්වා සිටියි.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

- 2017.09.14 දින SLBPC/2016-H/SCP/14/BP/2004 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකයට අදාළව ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල තිරණය අනුව පැමිණිලිකාරියට MM-01-01 ශ්‍රේණියට උසස්වීමක් ලබාදි ඇත. එම තිරණය මගින්ම එම නිලධාරිනියට ප්‍රවාහන දිමනාවක් ලබාදිමට තිරණය කර ඇත.
- 2017.10.02 දින MM-01-01 කළමණාකරු ධූරයට උසස්වීමක් ලබාදි පත්වීම් ලිපිය නිකුත් කර ඇති අතර, එහිදි ඇයට තම නිවසේ සිට කාර්යාලයට පැමිණීමට හා රාජකාරි කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදෙන බව සහ රාජකාරි වාහනයක් ලබාදිය නොහැකි නම් ප්‍රවාහන දීමනාවක් සහ ලිටර 120 ක ඉන්ධන දීමනාවක් ලබා දෙන බවට සඳහන් කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

- 2018 වර්ෂයේ මෙවැනි ආකාරයට MM-01-01 තනතුරේ සිට කළමණාකාරිනි නීති හා අභ්‍යාන්තර විගණන තනතුරේ සේවය කළ නිලධාරින් දෙදෙනාට අධ්‍යක්ෂ මණ්ඩල තිරණය අනුව ප්‍රවාහන දිමනාව ලබාදුන් බවත්

- පසුව 2017.01.08 දිනැතිව ඉහත දීමනා සඳහා අමාත්‍යාංශය අනුමැතිය ඉල්ලීම් කර ඇත. එහිදි 2019.01.28 දිනැති ලිපිය මගින් රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ 01/2015 අනුව රාජ්‍ය ව්‍යවස්ථාවන්හි නිල වාහන හිමිකාරිත්වය පවත්නේ කළමණාකරන චක්‍ර ලේඛ 30 අනුව HM-1-1 ශ්‍රේණිය හා ඊට ඉහල ගණයේ තනතුරු වලට නිලධාරින් සඳහා පමණක් බැවින් ඉහත ලබාදුන් දීමනාව නවතා දැමූ බවත්

- එසේ වුවද ඔවුන් විසින් නැවත ඉල්ලීම් කිරිමෙන් අනතුරුව විධිමත් තිරණයක් ගන්නා තුරු නැවත ප්‍රවාහන දීමනාව ගෙවා ඇත.

- පසුව හිටපු සභාපති විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත 2019.07.29 දාතමින් ලිපියක් යොමු කරමින් ඉහත දැක්වූ තිදෙනාට MM-1-1 ශ්‍රේණියට අදාළව ප්‍රවාහන දීමනාව ලබාදිම සඳහා අවසර ඉල්ලා ඇත.

- ඊට පිලිතුරු වශයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2019.09.30 දිනැතිව අංක - යොමු කළ ලිපියේ නිලධාරින් තිදෙනා සඳහා අදාළ වන්නේ 2015.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2025 වන බවත් අදාළ නිලධාරින් MM-01-01 කාණ්ඩයට අයත් බැවින් ඔවුන් හට ප්‍රවාහන හෝ ඉන්ධන දිමනා ලබා ගැනිමේ හිමිකමක් නොමැති බව දැක්වූ බවත්

- එසේ වුවද කාර්ය සාධනය ඉහල මට්ටමකින් පවත්වාගෙන යෑම අවශ්‍ය වන්නේ යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරන්නේ නම් ඒ සඳහා දිරි ගැන්වීමක් වශයෙන් යම් ප්‍රවාහන පහසුකමක් ලබාදීම සම්බන්ධයෙන් විරුද්ධතාවයක් නොමැති බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එම ලිපියේම දන්වා ඇති බව කියා සිටියි.

- තවද 2019.10.14 දිනැතිව පවත්වන ලද විගණන හා කළමණාකරණ රැස්වීමේදි දක්වා ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබි ඇත්නම් එම නිලධාරින් සඳහා අදාළ අනුමැතිය පරිදි කටයුතු කරන ලෙස උපදෙස් ලබාදි ඇත.

- එවකට සභාපති විසින් නැවත මෙම පැමිණිලිකාරිය 2019.10.22 දිනැති මෙමෝපත මගින් ප්‍රවාහන දීමනාව නැවත ලබාදි ඇත.

- මේ පිළිබඳව ආයතනයේ විගණන කමිටුව හා ජාතික විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද 2022.07.01, 2022.02.16, 2022.01.19 දිනැති විගණන විමසුම් මගින්ද මේ පිළිබඳව ප්‍රශ්න කර ඇත.

- 2019.09.30 දාතම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව යම් "ප්‍රවාහන දීමනා" පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා 2021.03.30 පැවැති විගණන කමිටුව තීරණය කරනු ලැබ ඇත.

- ඒ අනුව වැවිලි අමාත්‍යාංශය වෙතින් MM-1-1 කාණ්ඩයට අයත්වන නිලධාරින් හට ප්‍රවාහන හෝ ඉන්ධන දීමනාවක් ලබා ගැනීමේ හිමිකමක් නොමැති බවට (2021.10.21) දාතමින් දන්වා ඇත.

- ඒ අනුව ඉහත සඳහන් සියලුම කරුණු සලකා බලා 2021.12.28 දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලයට විසින් පැමිණිලිකාරියට ලබාදුන් ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව චක්‍රලේඛවලට පටහැනි නීත්‍යානුකුල නොවන තීරණයක් ලෙස නිගමනය කරමින් එය නතර කිරීමට තීරණය කළ බවත්

- එකී තීරණය පැමිණිලිකාරියට දන්වා යවා ඇති අතර, ඇය විසින් නැවත 2022.02.14 දිනැතිව ඒ පිළිබඳ සලකා බලන ලෙස ඉල්ලීමක් කර ඇත.

- ඒ අනුව නැවත මේ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා තීරණයක් ගත යුතු බවට තීරණය කර 2022.03.01 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව වැවිලි අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කළ බවත් තවද තවද 2022.09.16 වගණනය වෙතින්ද උපදෙස් ඉල්ලු බවත් දන්වා ඇත.

- තවද MM-01-01 ශ්‍රේණියේ සිටිනු ලබන නිලධාරියෙකුට හිමි ප්‍රවාහන පහසුකම වන ප්‍රවාහන පහසුකම සඳහා අදාළ අනුමැතියක් ලැබී ඇති බැවින් එය 2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක කරන බව තවදුරටත් දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

- පැමිණිලිකාරිය කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ තමාට පත්වීම් ලිපියටද ඇතුලත් කර ලබාදුන් ඉන්ධන දීමනාව හා ප්‍රවාහන දීමනාව අත්තනෝමතික ලෙස නවතා දැමු බවයි.

- එහිදී වගඋත්තරකාර පාර්ශවය අනුව දක්වා සිටිනුයේ මෙම පැමිණිලිකාරියට පත්වීම් ලිපියේ එය ඇතුලත් කර පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ලබාදුන්නද ඒ පිළිබද පසුව ලද විගණන විමසුම් ආදිය හේතුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැක්වූ කරුණු අනුව දැනට සිටින අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ දීමනාවන් ඉවත් කරවීමට කටයුතු කළ බවයි.

- ඒ අනුව පැමිණිලිකාරිය වෙත 2017.09.29 වන දින නිකුත් කළ පත්වීම් ලිපියට අවධානය යොමු කිරීමේදී එහි දක්වා ඇත්තේ "You Will be Provided with a Motor Vehicle to travel Home to office and for all other official business In case of that you are not provided with an official vehicle you will be given transport allowance as per the prevailing practice of SLPPC and you will be allocated 120 lit fuel per month

  ඒ අනුව එහි පැහැදිලිව දක්වා ඇත්තේ නිවසේ සිට කාර්යාලයට යාමට හා ඒමට වාහනයක් සපයන බවත් හා සියලුම රාජකාරි කටයුතු සදහා වාහන පහසුකම් සපයනු ලබන බවත් එසේ සැපයිමට නොහැකි නම් ප්‍රවාහන දීමනාව හා 120L ක ඉන්ධන ලබා දෙන බවයි.

- මෙහිදී මේ සදහා පදනම් වූ 2017.09.26 (18) දාතම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පිළිබදව අවධානය යොමු කිරීමේදී එහි දක්වා ඇත්තේ
  The Chairman /CEO Said as no vehicle allowance is applicable for the " MM " category he requested the Board to consider granting a vehicle allowance to Mrs. B.V.L.C Beneragama as she has been working continuously as an acting Manageress for the post so many years and also she had worked for the benefit of the organization. The chairman/CEO mentioned that the board had cancelled the vehicle allowance enjoyed by Mrs. B.V.L.C Beneragama earlier. As such, he requested the board to consider granting an allowance in her new appointment as the Manageress Procument

- ඒ අනුව 2017.09.26 මාණ්ඩලික තීරණය මගින් ඇයට වාහන දීමනාවක් ලබාදීමට අනුමත කර ඇත.

- පැමිණිලිකාරියට අමතරව මෙම ප්‍රවාහන දීමනාව කළමණාකරු - නීති හා අභ්‍යන්තර විගණකටද ලබාදී ඇති බවට කරුණු නිරීක්ෂණය වුවද පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි සිදුකරන විට ඔවුන් ආයතනයෙන් ඉවත්ව ඇති බවට කරුණු අනාවරණය වේ.

- මේ පිළිබදව ජාතික විගණන විමසුම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2019.09.30 ලිපි වලදී දැනට ලබන මෙම ප්‍රවාහන හා ඉන්ධන දීමනාව පැමිණිලිකාරියගේ වැටුප් ක්‍රමය අනුව හිමිකමක් නොමැති බව දක්වා ඇති බව අදාළ ලේඛන පිළිබද සැලකීමේදී කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

- ජාතික විගණන කාර්යාලය 2022.07.01 විගණකාධිපති වාර්තාවේ MM-1 කාණ්ඩයට අයත් නිලධාරින්හට වාහන දිමනාව හිමිනොවන නමුත් සංස්ථාව විසින් සමාලෝචිත වාර්ෂයේදි නිලධාරින් තිදෙනෙකු හට රු.1350000/- ක නිල වාහන දිමනාව රු. 224760/- ක ඉන්ධන දිමනාව ලබාදි ඇති බවට කරුණු දක්වා ඇති බවද ලේඛන අනුව නිරීක්ෂණය වේ.

- කෙසේ වෙතත් 2021.12.28 දාතම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ ඉන්ධන දීමනාව හා ප්‍රවාහන දිමනාව නතර කිරිමට තිරණය කර ඇති බවට කරුණු අනාවරණය වේ.

- පැමිණිලිකාරියගේ පත්වීම් ලිපියේ ප්‍රවාහනය සඳහා වාහනයක් ලබාදෙන බවත් නැතහොත් ප්‍රවාහන දීමනාව හා 120L ක ඉන්ධන දීමනාවක් ලබාදෙන බවට දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකාරියට අදාළ පත්වීම් ලිපියේ ප්‍රවාහනය සඳහා වාහනයක් හෝ ප්‍රවාහන + ඉන්ධන දීමනාව සඳහා අපේක්ෂාව ලබාදී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකාරියට පොදු ව්‍යාපාර කළමණාකරණ ආයතනය මගින් දක්වා ඇති ආකාරයට ආයතනයට යම් දීමනාවක් ලබාගැනීම සඳහා අපේක්ෂාවක් පවත්වා ගත හැකි බවට කරුණු නිරීක්ෂණය වන අතරම වගඋත්තරකාර පාර්ශවයද එම දීමනාව ලබාදිමට කටයුතු කරන බව 2023.12.08 දිනැති වාර්තාව මගින් දක්වා ඇත.

පැමිණිලිකාරිය MM-1 කාණ්ඩයට ඇතුලත් වන නිලධාරිනියක වන බැවින් HM කාණ්ඩයට හිමිකම් ඇති ප්‍රවාහන දීමනා ලබා ගැනීමේ හිමිකමක් ලබා නොදීම පිළිබඳව මුලික අයිතිවාසිකම් උල්ලංඝණය යටතේ ක්‍රියා කිරීමේ හැකියාවක් නොපැවතුනද අදාළ නිලධාරිනියගේ පත්වීම් ලිපිය (එනම් ගිවිසුම් ගතවීම) හා කාර්ය සාධනයද එකී නිලධාරිනියට පුර්වයෙන් ප්‍රවාහන දීමනාව ලබාදීම ද සලකා විශේෂ දිරිගැන්වීමක් වශයෙන් පැමිණිලිකාරියට පත්වීම් ලිපියේ ලබාදුන් අපේක්ෂාව සලකා බලා යම් ප්‍රවාහන දීමනාවක් හා පහසුකමක් ලබාදීම සුදුසු බව කොමිෂන් සභාවට පෙනී යයි.

ඒ අනුව කටයුතු කර මානව හිමිකම් කොමිෂන් සභාව 2024.08.28 දිනට ප්‍රථම දැනුවත් කිරිමට කටයුතු කරන ලෙස දන්වා සිටිමු.

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
... මානව හිමිකම් කොමිෂන් සභාව

සුමනලාල් විරසිංහ,
අධ්‍යක්ෂ - පරික්ෂණ හා විමර්ශන
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

වීරසිංහ එච්. සුමනලාල්
අධ්‍යක්ෂ - (පරික්ෂණ හා විමර්ශන) වැ.බ
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව